// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2152/68 – 2019 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා – 2019.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**සමථ මණ්ඩල කොමිෂන් සභාව**

සමථකාරවරුන් ලෙස පත් කිරීම සඳහා නාමයෝජනා කැඳවීමේ නිවේදනය

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 5(1) වැනි වගන්තිය මගින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් පහත සඳහන් 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 3 වන වගන්තිය යටතේ කරන නියමය ප්‍රකාර විදේශගත ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ශ්‍රී ලංකාව තුළ පැන නැගෙන දුක්ගැනවිලි හා අනෙකුත් ප්‍රශ්න සම්බන්ධ ආරවුල් පිළිබඳ විශේෂ සමථ මණ්ඩල සභාපති හා සමථකාරවරුන් පත්කර ගැනීම සඳහා නාමයෝජනා කැඳවනු ලැබේ.

**සමථ මණ්ඩල ප්‍රදේශය**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය

02. එකී සමථ මණ්ඩල සඳහා සමථකාරවරුන් පත් කිරීම පිණිස පහත 02 (I) යටතේ සඳහන් සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නම් ඉදිරිපත් කරන ලෙස මෙහි පහත සඳහන් කර ඇති 02 (II) හි (අ) පුද්ගලයින්ගෙන් (ආ) මණ්ඩලවලින්, දේශපාලනමය නොවන සංවිධානවලින් සහ ආයතනවලින් හා (ඇ) දිස්ත්‍රික් ලේකම්ගෙන්/ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මෙයින් ඉල්ලා සිටී.

(I) යම් සමථ මණ්ඩල ප්‍රදේශයකට, බල මණ්ඩලයට පත්වීමක් ලැබීමට හිමිකම් ඇත්තේ පහත සඳහන් තැනැත්තන්ට බැවින්, ඔවුන්ගේ නම් පමණක් පත්වීම පිණිස යෝජනා කළයුතු වේ.
එනම්,

(අ) වයස අවු. 35-70 අතර විය යුතු ය.

(ආ) විශේෂ සමථ මණ්ඩල බල ප්‍රදේශයේ පදිංචිකරුවකු විය යුතු ය.

(ඇ) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් පිළිගත් වෘත්තීය හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් වෘත්තීය හෝ අධ්‍යාපන සුදුසුකමක් ලබාගත් තැනැත්තෙකු විය යුතු ය ;

1A – PG4815 – 57 (2019/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) විදේශගත ශ්‍රමිකයින්ගේ ආරවුල් සහ දුක්ගැනවිලි නිරාකරණය කිරීමට අදාළ ක්ෂේත්‍රයක දැන ගැනීමක් සහ කුසලතා සහිත යම් තැනැත්තෙකු හෝ රාජ්‍ය සේවයේ නිලධාරියෙකු වශයෙන් සේවය කර ඇති හෝ සේවය කරමින් සිටින තැනැත්තෙකු විය යුතු ය.

(II) (අ) යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා තමන්ගේම හැර අන් අයගේ නාම ඉදිරිපත් කිරීමට පහත සඳහන් පුද්ගලයින්ට හිමිකම් ඇත්තේ ය.

(I) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි කාර්යාලයක නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරියෙකුට හෝ පළාත් සභා රාජ්‍ය නිලධාරියෙකුට,

(II) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පිහිටි ආගමික පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානියෙකුට,

(III) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින විශ්‍රාමලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානියෙකුට,

(ආ) යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට පහත සඳහන් මණ්ඩලවලට, සංවිධානවලට සහ ආයතනවලට හිමිකම් ඇත්තේ ය.

(I) යටත් පිරිසෙයින් අවුරුදු 05 තිස්සේ පවත්නා වූද, පහත සඳහන් එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන්නා වූ යම් මණ්ඩලයකට, සංවිධානයකට හෝ ආයතනයකට,

(අ) සමාජයේ අධ්‍යාපනික, ආගමික සදාචාරාත්මක හෝ අධ්‍යාත්මික වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා,

(ආ) සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම සඳහා,

(ඇ) ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා,

(ඈ) සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩිදියුණු කිරීම සඳහා,

(ඉ) සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවන් සැලැස්වීම සහ සපයා දීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩසටහන් සහ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා,

(ඇ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක විශේෂ මූල මණ්ඩලයට පත්කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්ට/ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිකම් ඇත්තේ ය.

03. (අ) ඉහත 02 වැනි ඡේදයේ සඳහන් වන පුද්ගලයින්, මණ්ඩල සංවිධාන සහ ආයතනවලට 2 (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති රාජ්‍ය නිලධාරින්ගේ නම් ඉදිරිපත් කිරීමට ඔවුන්ට හැකිවේ. කිසියම් පුද්ගලයෙකුට තමන්ගේම නාම යෝජනා කර ගැනීමට නොහැක.

(ආ) ඉහත 2 (ඇ) ඡේදයේ සඳහන් කර ඇති දිස්ත්‍රික් ලේකම්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට රාජ්‍ය නිලධාරින්ගේ නම් ඉදිරිපත් කළ හැකි අතර, ඒ අයගෙන් පස් දෙනෙකුට නොවැඩි ගණනක් කොමිෂන් සභාව විසින් අදාළ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත්කළ හැකි ය.

04. **නාමයෝජනා කිරීමේ ආකෘති පත්‍රය :**

(අ) පුද්ගලයින් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට අනුකූලව ය.
(ආ) මණ්ඩල සංවිධාන සහ ආයතන විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ආකෘති පත්‍රයට අනුකූලව ය.
(ඇ) දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ඇ' ආකෘති පත්‍රයට අනුකූලව ය.

එක් එක් නාමයෝජනාව වෙනම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ඡේදයේ දක්වා ඇති පරිදි නාමයෝජනාව ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවාම එහි ඇතුළත් කල යුතු ය.

05. නාමයෝජකගේ නිර්දේශය හේතු රහිත නිර්දේශයක් නොවිය යුතුය. සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳ සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතුය. උදාහරණයක් වශයෙන් ඔහුගේ/ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ

සේවය කළ නැතහොත් යෙදී සිටි කාලපරිච්ඡේදය ඔහු/ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේ නම් එය ද සඳහන් කළ යුතු ය.

06. කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාමයෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකි තරම් දුරට වැළකී සිටිය යුතුය. එහෙත් ප්‍රාදේශීය ලේකම්වරුන්ට/දිස්ත්‍රික් ලේකම් ට මෙම සීමාව අදාළ නොවේ.

07. සියලුම නාමයෝජනා 2019.12.24 දිනට හෝ ඊට පෙර **කොළඹ 12, අධිකරණ මාවත, අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල, අංක 80 ලිපිනයේ පිහිටි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන පරිදි එවිය යුතු ය.

08. කොමිෂන් සභාව විසින් සිය මතය අනුව සමථකරණ දක්ෂතා සහ ක්‍රම පිළිබඳ ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යෝග්‍ය සුදුසුකම් ඇති තැනැත්තන් මුලින් තෝරා ගනු ඇත.

**රාජනී අතපත්තු,**
ලේකම්,
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2019 දෙසැම්බර් මස 06 වැනි දින,
කොළඹ 12,
අධිකරණ මාවත,
අංක 80,
අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**"අ" ආකෘති පත්‍රය**

(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයින් විසින් පිරවීම සඳහා)

01. සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................

02. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................................................

03. නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :

(අ) සම්පූර්ණ නම : ..........................................................................................

(ආ) පදිංචි ලිපිනය : ..........................................................................................

(ඇ) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්වයෙන් ද යන බව : ..........................................................................................

(I) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
දෙපාර්තමේන්තුවේ නම : ..........................................................................................
රාජකාරී ලිපිනය : ..........................................................................................
ඔබ දරන තනතුර : ..........................................................................................

(II) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? නැතහොත් පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
එහි නම : ..........................................................................................
එහි ලිපිනය : ..........................................................................................
ඔබ දරන තනතුර : ..........................................................................................

(III) ඔබ විශ්‍රාමලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් විශ්‍රාමලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
ආයතනයේ නම : ..........................................................................................
ඔබ විශ්‍රාම ගන්නා විට දරන ලද තනතුර : ..........................................................................................
ඔබ පදිංචිව සිටින සමථ මණ්ඩල ප්‍රදේශය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) : ..........................................................................................
..........................................................................................

04. ඔබ විසින් නාමයෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

(අ) ඔහුගේ/ඇයගේ සම්පූර්ණ නම : ..........................................................................................

(ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ..........................................................................................

(ඇ) උපන් දිනය : ..........................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

(ඉ) දුරකථන අංකය : ..........................................................................................

(ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? : ..........................................................................................

(උ) ඔහු/ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? :
..........................................................................................

(ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න :
..........................................................................................

(එ) ඔබගේ නිර්දේශය ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. ..........................................................................................

..............................
අත්සන
(මුද්‍රාව තිබේනම්)

දිනය : ........................................

**"ආ" ආකෘති පත්‍රය**

(නාමයෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතුය)

01. සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................

02. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................

03. නාමයෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :

(අ) එහි නම : ..........................................................

(ආ) එහි ලියාපදිංචි/ රාජකාරි ලිපිනය : ..........................................................

(ඇ) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය : ..........................................................

(ඈ) එය කොතරම් කාලයක සිට පැවතෙන්නේ ද යන බව : ..........................................................

(ඉ) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය : ..........................................................

04. නාමයෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

(අ) ඔහුගේ/ඇයගේ සම්පූර්ණ නම : ..........................................................

(ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ..........................................................

(ඇ) උපන් දිනය : ..........................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................

(ඉ) දුරකථන අංකය : ..........................................................

(ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? : ..........................................................

(උ) ඔහු/ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? :
..........................................................

(ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න :
..........................................................

05. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ/ඇයගේ නාමයෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද? එසේනම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න.
..........................................................

06. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ඊට හේතු ද සමග සඳහන් කරන්න.
..........................................................

..........................................

ලේකම්

(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

දිනය : ..........................................................

**"ඇ" ආකෘති පත්‍රය**

(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිසාපති/ප්‍රාදේශීය ලේකම් විසින් පිරවිය යුතු ය)

01. සමථ මණ්ඩල ප්‍රදේශය : ....................................................................................................................................................

02. පරිපාලන දිස්ත්‍රික්කය : ....................................................................................................................................................

03. නාමයෝජනාව ඉදිරිපත් කරන දිසාපති / ප්‍රාදේශීය ලේකම් පිළිබඳ විස්තර :

(අ) ඔබගේ සම්පූර්ණ නම : ....................................................................................................................................

(ආ) ඔබගේ රාජකාරී ලිපිනය : ...............................................................................................................................

(ඇ) ඔබ දිසාපතිව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? : ..................................................................................................

(ඈ) ඔබ ප්‍රාදේශීය ලේකම්ව සිටින්නේ කුමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද? :

..............................................................................................................................

04. නාමයෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තර :

(අ) ඔහුගේ/ඇයගේ සම්පූර්ණ නම : ..........................................................................................................................

(ආ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න :

....................................................................................................................................................................

(ඇ) උපන් දිනය : ........................................................................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : .............................................................................................................................

(ඉ) දුරකථන අංකය : ..........................................................................................................................................

(ඊ) ඔහුගේ/ඇයගේ රාජකාරී ලිපිනය/පෞද්ගලික ලිපිනය : ..................................................................................

05. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිතව සඳහන් කරන්න.

....................................................................................................................................................................

.............................................

අත්සන

(මුද්‍රාව තිබේනම්)

දිනය : ........................................................

12-778

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.